**ඇමුණුම 01**

**වැඩිහිටියන්ට තම නිවස තුළ ජීවත්වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීමේ වැඩසටහනට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉදිරිපත් කරන උපදෙස් පත්‍රිකාව**

**01. වැඩසටහන පිළිබඳ හැඳින්වීම –** ජීවත් වීමට නිවසක් පැවතිය ද, ඇතැම් වැඩිහිටියන්ට ජීවත් වීමට අවශ්‍ය අවම පහසුකම්වත් අහිමි වීමෙන් විවිධ පීඩාවන්ට පත්වන අවස්ථා දක්නට ලැබේ. උදාහරණ වශයෙන්, නිදා ගැනීම සඳහා ඇඳක්, මෙට්ටයක් නොමැති වීම, වැසිකිළි පහසුකම් නොමැති වීම හෝ සෞඛ්‍යාරක්ෂිත වැසිකිලි නොමැති වීම ආදිය දැක්විය හැකිය. එසේම සිය නිවස ආශ්‍රිතව ගමන් කළ නොහැකි පරිදි ප්‍රවේශ මාර්ග අපහසුතා පැවතීම, ඇතැම් අවස්ථාවලදී පරිහරණය සඳහා අත්වැටක් අවශ්‍ය වීම හා ජීවත්වීමට පහසු වන පරිදි කාමරයේ අලුත්වැඩියා කටයුත්තක් සිදු කර ගැනීමට අවශ්‍ය වීම හා වැනි අවස්ථාවලදී මෙම වැඩසටහන මඟින් අවශ්‍ය මැදිහත් වීම ලබා දී වැඩිහිටි ඉල්ලීම් ඉටු කිරීමට හැකියාව පවතී.

ඒ අනුව, මෙම වැඩසටහන මඟින් වැඩිහිටියන්ට තම නිවාසයන්හි ජීවත් වීමේදී අවශ්‍ය කරනු ලබන අවම පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් සලසා ගැනීමේ අවස්ථා ලබා දීම සිදු කරනු ලැබේ.

## 02. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය

- වැඩිහිටියාට පහසු වන පරිදි කොමඩ් සවිකර ගැනීම හා වැසිකිළි ඉදිකිරීම සඳහා
- වැඩිහිටියා වෙනුවෙන් ඇඳක් , මෙට්ටයක්/වායු මෙට්ටයක් ලබා ගැනීම සඳහා
- නිවසේ වැඩිහිටියා වෙසෙන කොටස වැඩිහිටියාට ජීවත්වීමට අවශ්‍ය අවම පහසුකම් සහිත වන පරිදි අලුත්වැඩියා කටයුතු කිරීම සඳහා
- නිවස තුළ වැඩිහිටියාගේ ප්‍රවේශ පහසුකම් ඉහළ දැමීම වෙනුවෙන් අත් වැටවල් (Railing / Ramps) හා ප්‍රවේශ මාර්ග යනාදිය තැනීම සඳහා
- වෙනත් සුදුසු අවශ්‍යතා වෙනුවෙන්

## 03. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක

මෙම වැඩසටහන සඳහා සුදුසු වැඩිහිටියන් තෝරා ගැනීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සිදු කරනු ලැබිය යුතු අතර වැඩිහිටියාගේ ඉල්ලීම, අදාළ ඉල්ලුම් පත්‍රය මඟින් වසමේ ග්‍රාම නිලධාරිගේ තහවුරුවෙන්, වැඩිහිටි විෂය භාර නිලධාරිගේ නිර්දේශයෙන් යුතුව ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

II. එම ඉල්ලීම් අතරින් අවශ්‍යතාවයේ ප්‍රමුඛතාව මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් විසින් සිදු කළ යුතුය. මෙම කමිටුව ප්‍රාදේශීය ලේකම්ගේ/ සහකාර ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතිත්වයෙන් ද සමාජ සේවා නිලධාරි / වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/ සංවර්ධන නිලධාරි (වැඩිහිටි විෂය භාර) යන අයගෙන් එක් නිලධාරියෙකු හා පරිපාලන ග්‍රාම නිලධාරි/ වෙනත් සුදුසු නිලධාරියෙකුගේ සාමාජිකත්වයෙන් ක්‍රියාත්මක විය යුතුය.

III. අදාල කමිටුව විසින් තෝරාගන්නා ලද ප්‍රතිලාභීන්ගේ අයදුම්පත්‍ර සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව, එම තොරතුරු ඇතුළත් ප්‍රතිලාභී ලේඛණය, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහ ඇස්තමේන්තුව සහිතව මා වෙත යොමු කළ යුතුය. ( ඉල්ලුම්පත් මෙම කාර්යාලය වෙත එවීම අවශ්‍ය නොවේ.)

**IV.** ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී, අඩු ආදායම්ලාභී වැඩිහිටියන්, තනිව වෙසෙන හා රෝගාතුර වැඩිහිටියන් වෙසෙන අඩු පහසුකම් සහිත ගෘහ ඒකක, සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

vii. තවද, ඉදිකිරීමක් සිදු කිරීමේදී, වැඩිහිටියා කුලී පදනම මත නේවාසිකව සිටීනම් මේ සඳහා සුදුසුකම් නොලබයි. එක් වැඩිහිටියෙක් වෙනුවෙන් ලබා දිය යුත්තේ එක් ප්‍රතිලාභයක් පමණි.

VI. ඉල්ලුම්කරු තමාගේ නොවන ස්ථානයක දරුවකු /ඥාතියෙකු සමඟ රැඳී සිටීනම් එවැනි විටෙක අදාළ ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිකිරීම් සිදු කිරීමට නිවසේ හිමිකරුගේ කැමැත්ත පළ කර ඔහු/ඇය මිය යන තෙක් රැකබලා ගන්නා බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත යුතුය.

මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සකස් කරනු ලබන ප්‍රතිලාභ ලේඛනය ප්‍රාදේශීය ලේකම් විසින් මා වෙත නොපමාව එවිය යුතු අතර, ඉල්ලීම් ලැබෙන ප්‍රමුඛතාවය අනුව මුල්‍යාධාර ලබා දෙනු ලැබේ. 2024 අගෝස්තු 31 දිනට පෙර ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය.

VIII. නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් වෙත මුදල් ලබාදෙනු ලැබේ.

## 04. ක්‍රියාත්මක ක්‍රමවේදය-

I. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වෙනුවෙන් රු. 500,000.00 ක මුදලක් ලබාදෙන අතර, එක් වැඩිහිටියකු වෙනුවෙන් රු.100,000.00 ක උපරිම සීමාවකට යටත්ව ප්‍රතිලාභ ලබා දිය යුතුය.

ii. මේ යටතේ ඉදිකිරීම් සිදුකරන අවස්ථාවලදී අදාල ප්‍රතිලාභීන් සමග සරල ගිවිසුමකට එළඹීමෙන් හෝ ශ්‍රමය සපයා ගැනීමේ පදනම මත භාණ්ඩ සැපයීමෙන් හෝ ලියාපදිංචි සමිතියක් මගින් (වැඩිහිටි සමිති විශේෂය) අදාල ඉදිකිරීම සිදුකර කොටස් වශයෙන් මුදල් ගෙවීම සිදුකළ හැක.

iii. එමෙන්ම ග්‍රාම නිලධාරි වසම් 50 ක් ඉක්මවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා රු.1,000,000.00 ක් ලබාදිය හැකි අතර ඒ සඳහා ඉල්ලීම් ඇතුළත් ප්‍රමුඛතා ලේඛනයක් ඉදිරිපත් කළ හැක.

iv. ප්‍රතිලාභීන් වෙත ලබාදෙන ආධාර මුදල් සම්පූර්ණයෙන්ම වියදම් නොවුන අවස්ථාවකදී ඉතිරි මුදල් ප්‍රමාණය එක් අයෙකුට ලබාදිය හැකි උපරිමයකට යටත්ව වෙනත් ප්‍රතිලාභීන් වෙත ලබාදිය හැකිය. එහෙත් ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

v. එමෙන්ම ආධාර වෙනුවෙන් යවන ලද මුදලක් නැවත එවන්නේ නම් වැඩිහිටියන්ගේ සුබ සාධනය සඳහා වන ජාතික අරමුදල (ගිණුම් අංකය - 228075) නමින් ලියන ලද චෙක්පතක් මඟින් එවිය යුතුය.

## 05. පසු විපරම් කටයුතු සිදු කිරීම

i. මෙම ව්‍යාපෘතිවල සම්බන්ධීකරණය, මෙහෙයවීම, ප්‍රගතිය පිළිබඳ අධීක්ෂණය ඇතුළු පසුවිපරම් කටයුතු අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් කොට්ඨාශයේ වැඩිහිටි විෂය භාරව කටයුතු කරන නිලධාරි මඟින් සිදු කළ යුතුය.

ii. ආධාර මුදල් ලබාදී මාස 3ක් ඇතුළත අදාල කාර්ය අවසන් කර විෂය නිලධාරි විසින් අවසන් වාර්තාව සකස් කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.

iii. ඉදිකිරීම් සම්බන්ධ වැඩ අවසන් වාර්තාව, ඡායාරූප සහිතව ඉදිරිපත් කළ යුතුය.